# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1286/18 – 2003 මැයි 02 වැනි සිකුරාදා – 2003.05.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක 1.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1) වන වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) වන වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ද්‍රව පෙට්‍රෝලියම් වායු (Liquid Petroleum Gas) නිෂ්පාදකයන් සහ වෙළෙඳුන් වෙත මෙසේ විධාන කරනු ලැබේ.

1. ද්‍රව පෙට්‍රෝලියම් වායුව (Liquid Petroleum Gas) පිරවීම/නැවත පිරවීමේ අරමුණින් ඕනෑම පාරිභෝගිකයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ඕනෑම වර්ගයක හිස් ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සිලින්ඩරයක් භාරගැනීම.

2. එවැනි සිලින්ඩර සඳහා ද්‍රව පෙට්‍රෝලියම් වායුව (Liquid Petroleum Gas) පිරවීම හෝ එසේ කරනු ලැබීමට සැලැස්වීම.

3. සමාන ධාරිතාවයකින් යුත් ඕනෑම සිලින්ඩරයක් ඉදිරිපත් කරනු ලබන ඕනෑම පාරිභෝගිකයෙකු වෙත ද්‍රව පෙට්‍රෝලියම් වායුව (Liquid Petroleum Gas) අඩංගු සිලින්ඩරයක් අලෙවි කිරීම.

4. එම සිලින්ඩරය පුරවන/නැවත පුරවන ලද නිෂ්පාදකයා/වෙළෙන්දාගේ නාමය එම සිලින්ඩරය මතුපිට සලකුණු කිරීම.

5. ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සිලින්ඩර විකිණීම හෝ පිරවීම්/නැවත පිරවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පනවා ඇති ප්‍රමිතීන්, පිරිවිතරයන් සහ චර්යා පද්ධති ඇතොත් ඊට අනුකූලව ක්‍රියා කිරීම.

අධිකාරියේ අණ පරිදි,

ආර්. අයි. විමලසේන,
සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

වර්ෂ 2003 මැයි මස 02 වැනි දින,
කොළඹ.

05-369